බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**

---

## 2024 විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට 2024 වර්ෂයට ලියාපදිංචි වීමට ඔබ විසින් එවා ඇති **ලේඛනයන්හි නිරවද්‍යතාවය සනාථ කිරීමට යටත්ව** අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

## ලියාපදිංචි වීම සඳහා උපදෙස් මාලාව

උක්ත උපාධි පාඨමාලාව සඳහා පහත දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කර **2024-10-21 දිනට පෙර** ලියාපදිංචිය සම්පූර්ණ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් දිගුවට ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුළත් කර පිවිසිය හැකිය.

❖ **ගාස්තු ගෙවීම**

- සම්පූර්ණ පාඨමාලා ගාස්තුව - රු.250,000/-

➢ පාඨමාලා ගාස්තුව ඇතුලත් සම්පූර්ණ මුදල වන **රු. 250,000.00** ක මුදල එකවර ගෙවිය හැකිය. නැතහොත් පහත දැක්වෙන පරිදි වාරික වශයෙන් ගෙවිය හැකිය.

| ගාස්තුව | මුදල (රුපියල්) | අවසාන දිනය | ගෙවීම් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| පාඨමාලා ගාස්තු පළමු වාරිකය | 50,000.00 | 2024-10-21 | **පාඨමාලා ගාස්තු පළමු වාරිකය සඳහාම වෙන් වූ ගිණුම් අංකයක් ඔබ වෙත හිමි වේ.** ඔබට අදාළ ගිණුම් අංකයට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම හෝ VISA හෝ Master (debit/credit) කාඩ්පත් මගින් පාඨමාලා ගාස්තු පළමු වාරිකය (රු.50,000/-) ගෙවිය යුතුය (http://www.external.sjp.ac.lk/reg/) ❖ ***VISA හෝ Master (debit/credit) කාඩ්පත් මගින් ගාස්තු ගෙවීමේදී අමතර සේවා ගාස්තු අය කර ගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.*** |
| පාඨමාලා ගාස්තු දෙවන වාරිකය | 100,000.00 | 2025-05-30 | දෙවන වාරිකය පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුය. ගෙවීම් සිදු කළ යුතු ආකාරය පිළිබඳ විස්තර අදාල පරිදි **www.external.sjp.ac.lk** ඔස්සේ දැනුම් දෙනු ලැබේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. |

| | | | |
|---|---|---|---|
| පාඨමාලා ගාස්තු තෙවන වාරිකය | 50,000.00 | 2026-03-31 | තෙවන වාරිකය දෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුය. ගෙවීම් සිදු කළ යුතු ආකාරය පිළිබඳ විස්තර අදාල පරිදි **www.external.sjp.ac.lk** ඔස්සේ දැනුම් දෙනු ලැබේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. |
| පාඨමාලා ගාස්තු සිව්වන වාරිකය | 50,000.00 | 2026-05-29 | සිව්වන වාරිකය දෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුය. ගෙවීම් සිදු කළ යුතු ආකාරය පිළිබඳ විස්තර අදාල පරිදි **www.external.sjp.ac.lk** ඔස්සේ දැනුම් දෙනු ලැබේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. |

***VISA හෝ Master (debit/credit) කාඩ්පත් මගින් ගාස්තු ගෙවීමේදී අමතර සේවා ගාස්තු අය කර ගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.***

## ❖ ශිෂ්‍ය වාර්තා පොත

ඔබගේ උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණක් ලියාපදිංචිය සිදු කරනු ලැබේ. ශිෂ්‍ය වාර්තා පොතෙහි සහ උපාධි සහතිකයේ සඳහන් කරන්නේ ද එකී නම පමණි. පවත්නා නීති රීති අනුව ලියාපදිංචියෙන් පසුව ඔබගේ නමෙහි යම් සංශෝධනයක් වේ නම් එය ඔබගේ තුන්වන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණයට පෙර බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත අවශ්‍ය ලේඛන සමග ඉදිරිපත් කළ යුතු වේ.

## ❖ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම

2025 ජනවාරි මස සිට උක්ත උපාධි පාඨමාලාවට අදාල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නියමිත අතර 2027 අවසන් වන විට උපාධි පාඨමාලාව අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන බාහිර උපාධි පාඨමාලාවේ පළමු, දෙවන හා තෙවන වසර සඳහා සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන පරිදි විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය විසින් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ දේශන පවත්වනු ලබයි. එම දේශනවලට සජීවී ලෙස සහභාගී වීම අත්‍යාවශ්‍ය වන අතර, පසු භාවිතය සඳහා අදාල පටිගතකල දේශන ඉගෙනුම් කළමනාකරණ පද්ධතියෙහි **(LMS)** අදාල විෂය යටතේ ප්‍රදර්ශනය කරනු ලැබේ.

## ❖ උපාධි පරීක්ෂණ සඳහා අයදුම් කිරීම

පලමු/ දෙවන හා තෙවන වසර පරීක්ෂණ සඳහා **www.external.sjp.ac.lk** වෙබ් අඩවිය ඔස්සේ අයදුම්පත් කැඳවන අතර නියමිත දිනට අයදුම්පත් යොමු කළ යුතුය.

## ❖ <u>ලියාපදිංචි වීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග</u>

- ***ඡායාරූපය උඩුගත කිරීම***

පාස්පෝට් ප්‍රමාණයේ (3.5cm X 4.5cm) සුදු පැහැ පසුබිමක් සහිත වර්ණ ඡායාරූපයක් (ශිෂ්‍ය වාර්තා පොතට ඇතුලත් කිරීමට සුදුසු වන ආකාරයේ ඡායාරූපයක්) **www.external.sjp.ac.lk** යන අපගේ වෙබ් අඩවියට පිවිස අදාල ස්ථානයෙහි උඩුගත (upload) කළ යුතුය එය JPEG format ආකාරයට විය යුතුය. **එහි සම්පූර්ණ ධාරිතාවය 1MB නොඉක්මවිය යුතුය.**

- ***අනන්‍යතාවය තහවුරු කිරීමේ අයදුම්පත / Declaration Form***

මේ සමඟ පළ කර ඇති අනන්‍යතාවය තහවුරු කිරීමේ අයදුම්පතෙහි උක්ත සඳහන් පිරිවිතරයන් සහිත ඡායාරූපයක් අලවා, රජයේ විදුහලක විදුහල්පතිවරයකු, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිසුරුවරයකු, නීතිඥයකු හෝ රාජ්‍ය සේවයේ පරිපාලන නිලධාරියකු විසින් **අදාළ ඡායාරූපය මත අත්සන සහ නිලමුද්‍රාව තබා සහතික කරවා ගත යුතුය.**

සම්පූර්ණ කරන ලද අනන්‍යතාවය තහවුරු කිරීමේ අයදුම්පතෙහි scan පිටපත **www.external.sjp.ac.lk/reg** වෙත පිවිස **අදාල ස්ථානයේ උඩුගත (upload) කල යුතුය.**

- ***ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලේඛන තැපැල් මඟින් එවීම***

1. පාඨමාලා ගාස්තුව ගෙවන ලද රිසිට්පතෙහි මුල් පිටපත
    - බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කර ඇත්නම් මුදල් ගෙවන ලද රිසිට්පතෙහි මුල් පිටපත අවශ්‍ය වේ. (Customer Copy)
    - VISA හෝ Master (debit/credit) කාඩ්පත් මඟින් ගෙවීම් කර ඇත්නම් ඔබ විසින් ලබා දී ඇති විද්‍යුත් ලිපිනයට ලැබෙන ගෙවීම් කල බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනෙහි ඡායා පිටපත එවිය යුතුය.
2. අනන්‍යතාවය තහවුරු කිරීමේ ලේඛනයේ මුල් පිටපත (Declaration Form)
3. පාස්පෝට් ප්‍රමාණයේ (3.5cmx4.5cm) ඡායාරූප 02 (ඡායාරූපයේ පිටුපස අයදුම්පත් අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න)
4. ඔබ විසින් අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අ.පො.ස (උසස් පෙළ) සහතිකයේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කර නොමැති නම් පමණක් විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අ.පො.ස (උසස් පෙළ) සහතිකයේ සහතික කරන ලද පිටපත

ඉහත ලේඛන **2024-10-21 දිනට පෙර** පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ලිපිනය** -: **නියෝජ්‍ය ලේඛකාධිකාරී**<br>**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**<br>**තැ.පෙ. අංක 10**<br>**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**<br>**ගංගොඩවිල**<br>**නුගේගොඩ**

(ලිපි ලේඛන බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"2024 විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධියට ලියාපදිංචි වීමේ අයදුම්පත්‍රය "** යන්න සඳහන් කළ යුතුය.)

- ***ලියාපදිංචිය අවලංගු කිරීම***

ඔබ විසින් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරන ලද උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය ඇතුළු ලේඛනයන්හි අසත්‍ය හෝ ව්‍යාජ ලේඛන බව සනාථ වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ. එමෙන්ම ගෙවා ඇති කිසිදු මුදලක් ආපසු ගෙවනු නොලැබේ.

යම් හෙයකින් ඔබගේ ලියාපදිංචිය අවලංගු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර එය සලකා බැලීමෙන් පසු ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.

## *****ලියාපදිංචිය අවලංගු කිරීමේදී ගාස්තු නැවත ගෙවීම***

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචිය අවලංගු කිරීමේදී මුදල් නැවත ගෙවීමක් සිදු කරනු ලබන්නේ පහත සඳහන් හේතූන් වලට පමණි.

a) **ලියාපදිංචි වූ දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම්** සඳහා පමණක් ගෙවන ලද පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. මෙම කාල සීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

b) යම් අයකු බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී **ප්‍රථම වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය පැවැත්වීමට පෙර, රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන්** ලියාපදිංචි වුවහොත් ගෙවන ලද පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. ඒ සඳහා ශිෂ්‍ය වාර්තා පොත සමග ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

- ***විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ඉදිරි දැනුවත් කිරීම්***

මෙම පාඨමාලාවේ නම්නීකරණ වැඩසටහන 2024 දෙසැම්බර් මස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී පැවැත්වීමට නියමිතය. මෙම පාඨමාලාවට අදාළ නම්නීකරණ වැඩසහටන පිළිබඳ විස්තර, වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර, ලියාපදිංචිය දීර්ඝ කිරීම සහ උපාධි ප්‍රදානෝත්සවය ආදී සියලු කටයුතු සඳහා දැනුවත් කිරීම් **www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය ඔස්සේ පමණක් සිදුකරනු ලැබේ.**

එබැවින් නිරතුරුව අපගේ වෙබ් අඩවිය වෙත පිවිස අදාල ශීර්ෂ යටතේ ඇති නිවේදන පිළිබඳ දැනුවත් වීම අනිවාර්ය වේ.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024-09-20